ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන (අයි-මාර්ග) - 2024

--

ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහනේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2014 නොවැම්බර් 05 දින එළඹි අංක 3171 එස්ආර්අයි (එස්එෆ්) ණය ගිවිසුම, 2015 මැයි 28 දින එළඹි අංක 3221 එස්ආර්අයි සහ 3222 එස්ආර්අයි (එස්එෆ්) ණය ගිවිසුම්, 2015 දෙසැම්බර් 11 දින එළැඹි අංක 3325 එස්ආර්අයි සහ 3326 එස්ආර්අයි (එස්එෆ්) ණය ගිවිසුම්, 2017 දෙසැම්බර් 15 දින එළඹි අංක 3610 එස්ආර්අයි (එස්එෆ්) ණය ගිවිසුම යන ණය ගිවිසුම්වල IV ව්‍යවස්ථාවේ 4.03 වගන්තිය සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් සහ වැඩසටහනේ කාලය

වැඩසටහනේ ණය ගිවිසුම්වලට අනුව, එවකට උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය, වර්තමානයේ ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය වැඩසටහන ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. වැඩසටහනේ අරමුණ වන්නේ, ග්‍රාමීය ප්‍රජාව සහ සමාජ ආර්ථික මධ්‍යස්ථාන අතර මාර්ග ප්‍රවේශතාවය වැඩිදියුණු කිරීමය. මෙහි දිගුකාලීන බලපෑම වන්නේ ජාතික හා පළාත් මාර්ගවල ප්‍රවාහන කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම වේ. ණය ගිවිසුම්වලට අනුව, වැඩසටහනේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 117,780 කට සමාන එ.ජ.ඩො. මිලියන 906 ක් වන අතර ඉන් රු. මිලියන 104,000 කට සමාන එ.ජ.ඩො. මිලියන 800 ක් මූල්‍යනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟවී තිබුණි. ඉතිරි මුදල වූ රු. මිලියන 13,780 ක් ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කිරීමට අපේක්ෂිතය. ණය සැපයුම් ආයතනය ඔවුන්ගේ මූලික එකඟතාවය පරිදි කොටස් හතරක් යටතේ එ.ජ.ඩො. මිලියන 800 න් එ.ජ.ඩො. මිලියන 557 ක් නිදහස් කර තිබුණු අතර සාර්ව ආර්ථික අර්බුදයේ ප්‍රතිඵලයක් ලෙස ඉදිරි ණය සැපයුම් අත්හිටුවා තිබුණි. පසුව, අයි මාර්ග සහ දෙවන අයි මාර්ග වැඩසටහන් දෙකෙහිම දැනටමත් ආරම්භ කර ඇති වැඩ අවසන් නොකළ මාර්ගවල අත්‍යාවශ්‍ය පුනරුත්ථාපන කටයුතු සිදු කිරීම සහ සිදු කරන ලද පෙර වැඩ සඳහා ගෙවීම් පියවීමට දෙවන ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහනේ 4 වන අදියර යටතේ තවත් එ.ජ.ඩො. මිලියන 60 ක් ලබා දීමට තීරණය කර තිබුණි. වැඩසටහන එහි කටයුතු 2014 ජුනි 01 දින ආරම්භ කරන ලද අතර 2025 මාර්තු 31 දින වන විට නිමකිරීමට නියමිතය.

1.3 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ 2.1 වගන්තියේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට වැඩසටහනේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහනේ මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

වැඩසටහනේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම ඊට සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත්කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී ඒ සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හා වැරදි තනිව හෝ සාමුහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑම් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය හා වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම්කිරීම පිණිස වැඩසටහනේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත් අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.1 ගිණුම්කරණ අඩුපාඩු

	ගිණුම්කරණ අඩුපාඩු	වටිනාකම රු. මිලියන	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	විගණකගේ නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 07 ඡේදයට අනුව, ගනුදෙනු සහ සිද්ධීන් ඒවා සම්බන්ධ කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගත යුතුය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂයට අදාළව රු. මිලියන 31.62 ක් වූ අතුරු ගෙවීම් සහතික 02 ක වටිනාකම් සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති කෙරීගෙන යන වැඩ සමාන අගයකින් අඩුවෙන් දක්වා තිබුණි.	31.62	ගෙවීම් කර 2025 ගිණුම් පොත්වල සටහන් කර ඇත.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුගත වියයුතුය.
(ආ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 27 ඡේදයට අනුව, මූල්‍ය තත්ත්වය, මූල්‍ය ප්‍රකාශනවල සාධාරණ ලෙස ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, ජංගම වගකීම් යටතේ දක්වා ඇති රු. මිලියන 282.16 ක රඳවා ගැනීම් සිවිල් වැඩ කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු ලෙස ද ඇතුළත් කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති කෙරීගෙන යන වැඩ සමාන ප්‍රමාණයකින් වැඩියෙන් දක්වා තිබුණි.	282.16	සිවිල් වැඩ කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු ප්‍රතිපාදනයක් ලෙස වැරදි ලෙස සටහන් කර ඇති රඳවුම් මුදල් ජර්නල් සටහන් අංක JE/25/33 මගින් නිවැරදි කර ඇත.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුගත වියයුතුය.
(ඇ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 27 ඡේදයට අනුව, මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය තත්ත්වය සාධාරණ ලෙස ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, රු. මිලියන 2,083.87 ක අයකර	2,083.87	පසුගිය වසරවල විගණන නිරීක්ෂණවලට අනුව, ගිවිසුම් අවලංගු කරන ලද කොන්ත්‍රාත්වල අයවීම අවිනිශ්චිත වැඩ ආරම්භ කිරීමේ	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුගත වියයුතුය.

	නොගත් වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් සඳහා වෙන්කිරීම් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු ශේෂයක් ලෙසද දක්වා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු මුදල එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.		අත්තිකාරම් සඳහා වෙන්කිරීම් සිදුකරන ලදී.	
(ඇ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 27 ඡේදයට අනුව, මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය තත්ත්වය සාධාරණ ලෙස ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, ජංගම වගකීම් යටතේ දක්වා ඇති රු. මිලියන 122.36 ක පිරිවැය හිමිකම්පෑම් (Cost claims) ගෙවියයුතු ප්‍රමාද පොලී ලෙසද ගිණුම්ගත කර තිබුණි. එබැවින්, මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති කෙරීගෙනයන වැඩ එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.	122.36	සිවිල් වැඩ කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු ලෙස සාවද්‍යව වාර්තා කර තිබුණු රු. මිලියන 122.36 ක පිරිවැය හිමිකම්පෑම් සඳහා වෙන්කිරීම් ජර්නල් සටහන් අංක JE/25/34 මගින් නිවැරදි කර ඇත.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුගත වියයුතුය.
(ඉ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 08 හි 22 (අ) ඡේදයට අනුව, වර්තමාන වගකීම් සඳහා පමණක් වෙන්කිරීම් සිදුකළ යුතුය. කෙසේ වෙතත්, ඉංජිනේරුවරයා විසින් ප්‍රතික්ෂේප කරන ලද පිරිවැය හිමිකම් පෑම් සඳහා රු. මිලියන 1,129.93 ක වෙන්කිරීමක් සිදු කර තිබුණු . එබැවින්, මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති කෙරීගෙනයන වැඩ එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.	1,129.93	සිවිල් වැඩ කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු වෙන්කිරීම් ලෙස සාවද්‍ය ලෙස වාර්තා කර තිබුණු ඉංජිනේරුවරයා විසින් ප්‍රතික්ෂේප කරන ලද පිරිවැය හිමිකම්පෑම් ජර්නල් සටහන් අංක JE/25/35 මගින් නිවැරදි කර ඇත.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුගත වියයුතුය.
(ඊ)	මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට අනුව කෙරීගෙනයන වැඩ ශේෂය රු. මිලියන 26,767.80 ක් වූ අතර මූල්‍ය ප්‍රකාශනවල සටහන්වලට අනුව එය රු. මිලියන 28,776.60 ක් විය. එබැවින්, ශේෂයන් දෙක අතර රු. මිලියන 2008.80 ක වෙනසක් නිරීක්ෂණය විය.	2,008.80	මූල්‍ය ප්‍රකාශන සටහන් වල රු. මිලියන 2,008.80 ක සිවිල් වැඩ කෙරීගෙනයන වැඩ යටතේ වාර්තා කර ඇත.	මූල්‍ය ප්‍රකාශන අත්සන් කිරීමට පෙර ගණකාධිකාරීවරයා මූල්‍ය ප්‍රකාශනවල නිරවද්‍යතාවය පිළිබඳව සහතික විය යුතුය.

(ඇ)	වත්මන් බැදීම්වල වටිනාකම නිශ්චිතව තහවුරු කරගැනීමකින් තොරව, 2024 දෙසැම්බර් 31 දිනට ආරවුල් නිරවුල් මණ්ඩල සහ බේරුම්කරණ හිමිකම් සඳහා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ රු. මිලියන 3,176.89 ක ප්‍රතිපාදනයක් දක්වා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, කෙරීගෙනයන වැඩ එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.	3,176.89	ආරවුල් නිරවුල් මණ්ඩල සහ බේරුම්කරණ හිමිකම් පිළිබඳ විස්තර සති දෙකක් ඇතුළත විගණනයට ඉදිරිපත් කරනු ලැබේ.	මූල්‍ය ප්‍රකාශන අත්සන් කිරීමට පෙර ගණකාධිකාරීවරයා මූල්‍ය ප්‍රකාශනවල නිරවද්‍යතාවය පිළිබඳව සහතික විය යුතුය.
(ඈ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 05 හි 43(අ) ඡේදයට අනුව, එක් එක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඇතුලත් වත්කම් සහ වගකීම්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ අවසාන දිනයේ පැවති විදේශ විනිමය අනුපාතයට පරිවර්තනය කළ යුතුය. කෙසේ වෙතත්, ඉහත අවශ්‍යතාවයට අනුව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඇතුලත් වැඩසටහනේ විදේශ ණයට අදාළ විනිමය අනුපාත වෙනස්කම් ගැලපීම (parity adjustment) ගණනය කර දැක්වීම හෝ හෙළිදරව් කිරීම සිදුකර නොතිබුණි.	-	රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ලබා දී ඇති උපදෙස් අනුව, ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශනවල විනිමය අනුපාත වෙනස්කම් ගැලපීම අවශ්‍ය නොවේ.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුගත වියයුතුය.

2.2 නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම

	නීති, රීති සහ රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	විගණකගේ නිර්දේශය
(අ)	2020 පෙබරවාරි 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020.	වැඩසටහන මගින් පවත්වන ලද භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල පිළිබඳ වාර්තාව, පළාත් වාර්තා සමඟ ඊලග වසරේ ජූනි 15 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය සඳහා අදාළ වාර්තාව 2025.07.09 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.	සමීක්ෂණ මණ්ඩල කටයුතු අවසන් කර ඇති අතර වාර්තාව 2025.06.27 දිනට පෙර ඉදිරිපත් කරනු ලැබේ.	චක්‍රලේඛය ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණ සිදු කළ යුතුය.

(ආ)	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1)(ඉ) වගන්තිය.	සියලුම විගණන විමසුම්වලට විගණකාධිපතිවරයා විසින් නියම කර ඇති පරිදි නිශ්චිත කාලය තුළ පිළිතුරු සපයන බවට ප්‍රධාන ගනන්දීමේ නිලධාරියා සහ ගනන්දීමේ නිලධාරියා විසින් සහතික විය යුතු වුවද, 2025 මාර්තු 27 සහ 2024 දෙසැම්බර් 12 යන දිනවල නිකුත් කරන ලද විමසුම් දෙකක් සඳහා දින 82 සිට 166 දක්වා ප්‍රමාදව පිළිතුරු ලබා දීම සිදුකර තිබුණි.	මාර්ග පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම සම්පූර්ණ කටයුතු අවසන් කර ඇති අතර සියලුම පළාත් මාර්ග කාර්යාල වසා දමා ඇත. බොහෝ ඉංජිනේරු කාර්ය මණ්ඩලය ද මාර්ග සංවර්ධන අධිකාරියෙන් ඉල්ලා අස්වී ඇත. ඒ අනුව, 2025.06.20 දිනැති MOH/HWY/ACC18/2022/13(v-i) අංක දරන ලිපිය මගින් 2025.07.09 දක්වා කාලය දීර්ඝ කරන ලෙස ඉල්ලා ඇත.	සියලුම විගණන විමසුම් වලට ප්‍රමාදයකින් තොරව පිළිතුරු දීමට පියවර ගත යුතුය. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1)(ඉ) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව අවශ්‍යතාවය අවධාරණය කරමින් උපදෙස් ලබා දිය යුතුය.
(ඇ)	2019 මාර්තු 05 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 හි 9.3 වගන්තිය	ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව අවම වශයෙන් මාස දෙකකට වරක්වත් රැස්විය යුතුය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළ එක් රැස්වීමක් පමණක් පවත්වා තිබුණි.	2024.08.02 සහ 2024.11.08 යන දිනවල මෙහෙයුම් කමිටු රැස්වීම් දෙකක් පවත්වා ඇත.	ප්‍රධාන ගනන්දීමේ නිලධාරියා විසින් මෙහෙයුම් කමිටු රැස්වීම් අදාළ චක්‍රලේඛවලට අනුකූලව පවත්වන බවට සහතික විය යුතුය.
(ඇ)	2019 ජනවාරි 12 දිනැති කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක DMA/01/2019	ව්‍යාපෘති අභ්‍යන්තර විගණන සමාලෝචන කමිටුවක් ස්ථාපිත කළ යුතු අතර වාර්ෂිකව අවම වශයෙන් රැස්වීම් 04 ක් පැවැත්විය යුතුය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂයේ එක් රැස්වීමක් පමණක් පවත්වා තිබුණි.	2024.03.04 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපිය මගින් අයි මාර්ග වැඩසටහනේ අභ්‍යන්තර විගණක තනතුර අහෝසි කර ඇත. එබැවින් වැඩසටහනේ අභ්‍යන්තර විගණන කාර්යය නිසි ලෙස ඉටු කර නොතිබුණි.	ප්‍රධාන ගනන්දීමේ නිලධාරියා විසින් අදාළ චක්‍රලේඛවලට අනුකූලව අභ්‍යන්තර විගණන සමාලෝචන කමිටු රැස්වීම් පවත්වන බවට සහතික විය යුතුය.

3. භෞතික කාර්යසාධනය

3.1 ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

(අ) මාර්ග දිග

සංරචකය	ක්‍රියාකාරකම	2024 දෙසැම්බර් 31 දිනට		විගණන නිරීක්ෂණය	ප්‍රමාදය සඳහා හේතු
		අපේක්ෂිත භෞතික කාර්යසාධනය කි.මී.	ලඟාකරගත් කාර්යසාධනය කි.මී.		
ජාතික සහ ග්‍රාමීය මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු සම්පූර්ණ කිරීම	ජාතික මාර්ග ග්‍රාමීය මාර්ග	කි.මී. 400 කි.මී. 3100	කි.මී. 178.19 කි.මී. 2870	2024 දෙසැම්බර් 31 දින වන විට වසර 10 ක් ගතවී ඇතත්, වැඩසටහන විසින් ජාතික මාර්ග කි.මී. 178.19 ක් සහ ග්‍රාමීය මාර්ග කි.මී. 2,870 ක් පමණක් සම්පූර්ණ කර තිබුණි. එය පිළිවෙලින් සියයට 45 ක් සහ සියයට 93 ක් නියෝජනය විය. පහසුකම් පරිපාලන අත්පොතට අනුව ව්‍යාපෘති කළමනාකරණ වියදම් ලෙස රු. මිලියන 1,950 ක් වෙන් කර තිබුණද, 2024 දෙසැම්බර් 31 වන විටත් වැඩසටහන රු. මිලියන 2,501.80 ක මුදලක් භාවිතා කර ඇති බව නිරීක්ෂණය විය.	බොහෝ කොන්ත්‍රාත්කරුවන් තම වැඩ අත්හිටුවා ඇති අතර, කොන්ත්‍රාත්කරුවන්ගේ දුර්වල ක්‍රියාකාරිත්වය, කොන්ත්‍රාත් ගෙවීම් ප්‍රමාද වීම දුර්වල ප්‍රගතියට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	ආසියානු සංවර්ධන බැංකුව විසින් වෙන් කරන ලද රු. මිලියන 1,950 ඉක්මවා ප්‍රතිපාදන ලබා ඇත. කෙසේ වෙතත්, විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට (වි.ස.දෙ.) ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත.
විගණකගේ නිර්දේශය	ව්‍යාපෘතිය නිසි ක්‍රියාකාරී සැලැස්මක් සහ අයවැයක් සකස් කළ යුතු අතර ඒ අනුව වගකීම් නියම කළ යුතුය. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1)(ඇ) වගන්තියේ විධිවිධානවලට අනුකූලව සිදු කරන සමාලෝචනයේදී උපදෙස් නිකුත් කළ යුතුය.

(ආ) මාර්ග සංඛ්‍යාව

සංරචකය	ක්‍රියාකාරකම	2024 දෙසැම්බර් 31 දිනට		විගණන නිරීක්ෂණය	ප්‍රමාදය සඳහා හේතු
		අපේක්ෂිත භෞතික කාර්යසාධනය කි.මී.	ලඟාකරගත් කාර්යසාධනය කි.මී.		
ග්‍රාමීය මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු	මාර්ග ප්‍රතිසංස්කරණය	735	604	ග්‍රාමීය මාර්ග 604 ක් පමණක් නිම කර තිබුණු අතර ග්‍රාමීය මාර්ග 14 ක් දෙවන අයි මාර්ග වැඩසටහනේ	බොහෝ කොන්ත්‍රාත්කරුවන් තම වැඩ

සම්පූර්ණ කිරීම		අත්‍යාවශ්‍ය වැඩ ඉටුකිරීමේ වැඩසටහනට (Critical works program) මාරු කරන ලද අතර එය වැඩසටහනේ සමස්ථ කාලය ඇතුළත නිම කිරීමට සැලසුම් කර තිබුණි. අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන්, රාජ්‍ය වියදම් සමාලෝචන කමිටුවේ නිර්දේශය පරිදි, මාර්ග ප්‍රතිසංස්කරණය කර වාහන ධාවනය කළහැකි තත්ත්වයට පත් කිරීමෙන් පසු නැවත භාරදීමේ ප්‍රගතිය සත්‍යාපනය කළ නොහැකි විය.	අත්හිටුවා ඇති අතර, කොන්ත්‍රාත්කරුවන්ගේ දුර්වල ක්‍රියාකාරීත්වය, කොන්ත්‍රාත් ගෙවීම් ප්‍රමාද වීම දුර්වල ප්‍රගතියට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	සති දෙකක් ඇතුළත විගණනයට විස්තර ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.
විගණකගේ නිර්දේශය	කමිටු නිර්දේශවලට අනුකූල විය යුතු අතර කමිටු නිර්දේශවලට අනුකූල නොවීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්විය යුතුය.

3.2 කොන්ත්‍රාත් පරිපාලනය

	විගණන නිරීක්ෂණය	**කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම**	**විගණකගේ නිර්දේශය**
(අ)	ණය නියෝජිතායතනය විසින් අරමුදල් සීමා කිරීම් නිසා කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීම් ප්‍රමාද වීම සහ මාර්ග ප්‍රතිසංස්කරණ කොන්ත්‍රාත් විෂයපථය සීමාකිරීම (Descope) හේතුවෙන් 2024 දෙසැම්බර් 31 දිනට වූ රු. මිලියන 4,192.92 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් අයකර ගැනීමේ හැකියාව අවිනිශ්චිතව පැවතුණි.	අත්තිකාරම් අයකර ගැනීම සඳහා යාන්ත්‍රණයක් සකස් කිරීමට ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් කොන්ත්‍රාත්කරුවන් සමඟ සාකච්ඡාවට කිහිපයක් පැවැත්වන ලදී.	අත්තිකාරම් අයකර ගැනීමට වහාම පියවර ගත යුතුය.
(ආ)	පැකේජ 53 ක් යටතේ ග්‍රාමීය මාර්ග සහ ජාතික මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමට වැඩසටහන විසින් සැලසුම් කර තිබුණි. මෙම පැකේජ අතරින් විවිධ හේතූන් මත පැකේජ 11 ක මුලික කොන්ත්‍රාත් වටිනාකම වැඩි කර තිබුණි. කෙසේ වෙතත්, එම කොන්ත්‍රාත් පැකේජවල කොන්ත්‍රාත් වටිනාකමෙහි සමුච්චිත වැඩිවීම රු. මිලියන 2,071.51 ක් විය.	එකඟවෙමි.	ව්‍යාපෘති ක්‍රියාකාරී සැලැස්ම සහ අයවැය සකස් කර අනුමැතිය ලබා ගත යුතුය. අමතර පිරිවැය වළක්වා ගැනීම සඳහා කොන්ත්‍රාත් කාලීනව අවසන් කිරීමට පියවර ගත යුතුය.

අකාර්යක්ෂම කොන්ත්‍රාත් කළමනාකරණය නිසා මිල විචලනයන්ට වූ බලපෑම වැඩසටහන් කාලය දීර්ඝ කිරීම සහ මෙම කොන්ත්‍රාත් වටිනාකමෙහි වැඩිවීම සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

3.3 වාහන උපයෝජනය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	විගණකගේ නිර්දේශය
2015-2017 කාලය තුළ වැඩසටහන මගින් රු. මිලියන 1,499.58 ක වියදමින් මෝටර් රථ 167 ක් සහ මෝටර් බයිසිකල් 168 ක් මිලදී ගෙන ඇති අතර මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කිරීමට පෙර මෝටර් රථ 156 ක් සහ මෝටර් බයිසිකල් 166 ක් මාර්ග සංවර්ධන අධිකාරියට භාර දී තිබුණි. 2024 ජනවාරි 10 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 1/2024 හි 4.4 වගන්තියට අනුව නිසි අනුමැතියකින් තොරව ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය හා පළාත් කාර්යාලවල භාවිතය සඳහා වාහන 09 ක් කුලී පදනම මත ලබාගැනීමට වැඩසටහනට සිදුව තිබුණු අතර 2024 දෙසැම්බර් 31 වන විට වාහන කුලී ලෙස රු. මිලියන 9.82 ක මුදලක් ගෙවා තිබුණි. තවද, 2024 දෙසැම්බර් 31 දක්වා රු. මිලියන 89.06 ක සමුච්චිත වාහන කුලී ගාස්තුවක් වැඩසටහනට දැරීමට සිදුව තිබුණු බව නිරීක්ෂණය විය.	මා.සං.අධි. හි වාහන පූර්ණ භාවිතයේ තිබූ බැවින්, අදියර 4 මගින් වෙන් කරන ලද අරමුදල් යටතේ ජාතික මාර්ග සහ නැවත ලංසු තැබූ කොන්ත්‍රාත් පැකේජවල සිදු කරනු ලබන මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා, නිසි ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටි අනුගමනය කරමින් ජාතික අයවැය චක්‍රලේඛ අංක 01/2024 නිකුත් කිරීමට පෙර 2023 වර්ෂයේදී වාහන දහහතරක් (14) කුලී පදනමින් ලබාගන්නා ලදී. 2023 වර්ෂය සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි වාහන සැපයුම්කරුවන් මත පදනම්ව ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු කරන ලදී.	වත්කම් වැරදි ලෙස කළමනාකරණය කිරීම සහ අවභාවිතය සම්බන්ධයෙන් හඳුනාගත් වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් විමර්ශනයක් පැවැත්විය යුතුය.

3.4 ව්‍යාපෘති අරමුණු වලට පරිබාහිරව සිදුකරන ලද ගෙවීම්

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	විගණකගේ නිර්දේශය
(අ)	2024 දෙසැම්බර් 31 දිනට වැඩසටහන විසින් ණය මුදලේ වියපැහැදම් නොවූ අරමුදල් මත සමුච්චිත බැඳීම් ගාස්තු ලෙස එ.ජ.ඩො. මිලියන 1.45 කට සමාන රු.මිලියන 248.27 ක් අනාර්ථිකව ණය නියෝජිත ආයතනය වෙත ගෙවා තිබුණි.	සැලසුම් කළ කාල සීමාව තුළ වාරික භාවිතා කිරීමෙන්, බැඳීම් ගාස්තු අවම කර ගත හැකිය.	වැඩසටහන නිසි ක්‍රියාකාරී සැලැස්මක් සහ අයවැය සකස් කළ යුතු අතර බැඳීම් ගාස්තු අවම කිරීම සඳහා ඒ අනුව වගකීම් නියම කළ යුතුය.
(ආ)	කොන්ත්‍රාත් කොන්දේසි 108.4 උප වගන්තිවලට අනුව, වැඩසටහන අවසානයේ සියලුම රසායනාගාර, ගෘහ	මා.සං.අධි. සතුව දැනට ප්‍රමාණවත් තරම් රසායනාගාර උපකරණ ඇති අතර එවැනි උපකරණ ගබඩා කිරීම	කොන්ත්‍රාත්තුවේ විශේෂ කොන්දේසි බලාත්මක කිරීමට

භාණ්ඩ සහ මැනුම් උපකරණ කොන්ත්‍රාත්කරු වෙත ආපසු ලබා දෙනු ලැබුවද, කොන්ත්‍රාත් පැකේජ 23 කට අදාළ රසායනාගාර, ගෘහ භාණ්ඩ සහ මැනුම් උපකරණ සඳහා රු. මිලියන 397.77 ක එකවර ගෙවීමක් සිදුකර තිබුණි. මේ අනුව, අහිතකර කොන්ත්‍රාත් කොන්දේසි කොන්ත්‍රාත්කරුවන්ට අනවශ්‍ය ප්‍රතිලාභ ලබා දීමට ඉවහල් වී තිබුණි.	සඳහා ඉඩකඩ ද නොමැත.	පෙර සූක්ෂමව සමාලෝචනය කළ යුතුය.

3.5 ඌන උපයොජිත සම්පත්

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	විගණකගේ නිර්දේශය
රට තුළ පැවති සාර්ව ආර්ථික අර්බුදයේ ප්‍රතිඵලයක් ලෙස මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු අත්හිටුවා තිබුණි. පසුව, 2023 ඔක්තෝබර් 09 දිනැති අංක 23/1830/608/070-II දරන අමාත්‍ය මණ්ඩල අනුමැතිය යටතේ අයි මාර්ග සහ දෙවන අයි මාර්ග වැඩසටහන් දෙකටම අදාළව, දැනටමත් ආරම්භ කර ඇති සහ අසම්පූර්ණ මාර්ග කොටස්වල තීරණාත්මක කටයුතු (Critical works) සිදු කිරීම සහ සිදු කරන ලද පෙර වැඩ සඳහා ගෙවීම් කිරීමට දෙවන ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහනේ 4 වන අදියර යටතේ තවත් එ.ජ.ඩො. මිලියන 60 ක් ලබා දීමට තීරණය කර තිබුණි. 4 වන අදියර යටතේ ලැබුණු අරමුදලෙන්, 2024 දෙසැම්බර් 31 දින වන විට සිවිල් වැඩ සහ උපදේශන කටයුතු සඳහා රු. මිලියන 4,594.82 ක් ගෙවා තිබුණි. 2024 ආරම්භයේ දී ඉහත තීරණාත්මක වැඩකටයුතු වැඩසටහන යටතේ ආරම්භ කරන ලද අතර වැඩ නිම නොකරන ලද මාර්ග අතරින් ග්‍රාමීය මාර්ග 20 ක සහ ජාතික මාර්ග 18 ක පුනරුත්ථාපන කටයුතු පමණක් තීරණාත්මක වැඩ ඉටුකිරීමේ වැඩසටහනට මාරු කර තිබුණි. වැඩ නිම නොකරන ලද මාර්ග සම්බන්ධයෙන් 2024 දෙසැම්බර් 31 වන විට රු. මිලියන 4,192.93 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් හිඟව පැවතුනද, එම හිඟ ශේෂයන් අයකර ගැනීම සඳහා වූ ඵලදායී සැලැස්මක් විගණනයට අනාවරණය නොවුණි.	අරමුදල් සීමාවීම හේතුවෙන් බොහෝ කොන්ත්‍රාත්තුවල විෂයපථය සීමා කරන ලදී. කොන්ත්‍රාත්කරුවන්ගේ කැමැත්ත ඇතිව, නොගෙවූ අතුරු ගෙවීම් සහතික, රඳවා ගැනීමේ මුදල් ආදිය මගින් අත්තිකාරම් අයකර ගැනීම සඳහා යාන්ත්‍රණයක් සකස් කිරීම සඳහා ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය කොන්ත්‍රාත්කරුවන් සමඟ සාකච්ඡා කිහිපයක් පවත්වන ලදී.	බැඳුම්කර මුදල් කර ගැනීමට වහාම පියවර ගත යුතු අතර විධිමත් පරීක්ෂණයක් පවත්වා අලාභය අය කර ගත යුතුය.

3.6 මතභේදයට තුඩුදෙන කරුණු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	විගණකගේ නිර්දේශය
(අ)	වැඩසටහනේ විවිධ අංශවල භෞතික හා ආශ්‍රිත කළමනාකරණ කටයුතු සඳහා සහාය වීමට වෙබ් අඩවි පාදක තොරතුරු ද්වාරයක් (Web-based information portal) ස්ථාපිත කිරීම	මාර්ග සංවර්ධන අධිකාරියේ සැලසුම් අංශයට සහාය වීමට වෙබ් අඩවි පාදක GIS තොරතුරු	වගකිව යුතු පාර්ශ්වයන් හඳුනා ගැනීම සඳහා විධිමත් පරීක්ෂණයක් පැවැත්විය යුතුය.

සඳහා වැඩසටහන විසින් 2016 දී වෙබ් අඩවි පාදක GIS තොරතුරු පද්ධතියක් (Web-based GIS information system) ප්‍රසම්පාදනය කර තිබුණි. මූල්‍ය ප්‍රකාශනවලට අනුව දරන ලද මුළු පිරිවැය රු. මිලියන 13.31 කි. ඉහත මූලික පිරිවැයට අමතරව, 2017 සිට 2022 ඔක්තෝබර් දක්වා වසර 6 ක් සඳහා වාර්ෂික මෘදුකාංග නඩත්තු ගාස්තුව සඳහා වැඩසටහන රු. මිලියන 10.33 ක් ගෙවා තිබුණු අතර එබැවින්, ඉහත පද්ධතිය සඳහා වැඩසටහන මගින් දරන ලද සමුච්චිත පිරිවැය රු. මිලියන 23.64 කි. කෙසේ වෙතත්, වැඩසටහන 2022 ඔක්තෝබර් 31 දිනෙන් පසු සේවා ගිවිසුම දීර්ඝ කර නොතිබුණි. එබැවින්, ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා නිසි අධිකාරියක් සහ ඇගයීමක් නොමැතිව සේවා ගිවිසුම අත්හිටුවා තිබූ බවට විගණනයේදී නිරීක්ෂණය විය. මාර්ග සංවර්ධන අධිකාරියේ සැලසුම් අංශයට සහ වැඩසටහනට සහාය වීම සඳහා මෙම පද්ධතිය භාවිතා කිරීමට සැලසුම් කර තිබුණද, සේවා ගිවිසුම අත්හිටුවීම හේතුවෙන් එය සාක්ෂාත් කරගත නොහැකි විය. එබැවින්, දරන ලද මුළු පිරිවැයම වැඩසටහනට ආර්ථික නොවන බව නිරීක්ෂණය විය.

(ආ) **අයි මාර්ග වැඩසටහන යටතේ බලංගොඩ - බෝවත්ත - කල්තොට මාර්ගය ප්‍රතිසංස්කරණය**

2022 වසරේදී ආර්එම්සී 04 පැකේජය යටතේ පැල්මඩුල්ල-ඇඹිලිපිටිය-නෝනාගම මාර්ගයේ විචලනයක් (Variation) ලෙස බලංගොඩ-බෝවත්ත-කල්තොට මාර්ගය 2022 වර්ෂයේදී ප්‍රතිසංස්කරණය කරන ලදී. මෙම මාර්ගයේ මුළු දිග කි.මී. 16 ක් වන අතර, පැල්මඩුල්ල-ඇඹිලිපිටිය-නෝනාගම මාර්ගයේ ප්‍රතිසංස්කරණ කටයුතු දැනටමත් ප්‍රදානය කර ඇති කොන්ත්‍රාත්කරුවන් 04 දෙනාටම ප්‍රදානය කර තිබුණි. පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i)	මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් මෙම පුනරුත්ථාපන කටයුතු අනුමත කර තිබුණේ ණය ප්‍රදාන ආයතනයේ එකඟතාවය ලබාගැනීම සහ ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටි අනුගමනය කිරීමට යටත්ව වුවද, එම එකඟතා ලබාගෙන නොමැති අතර, අදාළ ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටි අනුගමනය කිරීමෙන් තොරව ඉදිකිරීම් කටයුතු ජාතික වෙසක් උත්සවයට පෙර එහි කටයුතු අවසන් කිරීම සඳහා කඩිනම් පියවර ගන්නා ලෙස ජනාධිපතිතුමා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම්වරයාට උපදෙස් ලබාදී තිබුණි. එබැවින්, ආර්එම්සී / 04 කොන්ත්‍රාත්කරුවන්ට	පද්ධතිය භාවිතා කිරීම සඳහා සේවා ගිවිසුම අලුත් කිරීමට පියවර ගෙන ඇත. 2025 අප්‍රේල් මාසයේදී GIS සොලුයුෂන් පුද්ගලික සමාගම වෙතින් නව යෝජනාවක් ලබා ගන්නා ලද අතර එය සලකා බැලීමේ අදියරේ පවතී.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුකූල විය යුතු අතර අනුකූල නොවීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව පියවර ගත යුතුය.

	කොන්ත්‍රාත්කරුට ප්‍රදානය කර තිබූ බව නිරීක්ෂණය විය.	විචලන නියෝග නිකුත් කිරීමෙන් එය සිදු කිරීමට උපදෙස් දෙන ලදී.	
(ii)	විගණනයට ඉදිරිපත් කරන ලද විස්තරවලට අනුව, අමාත්‍යාංශය විසින් මූලික පරීක්ෂණයක් පවත්වන ලද අතර අදාළ වාර්තාව 2023 නොවැම්බර් 30 දින අධ්‍යක්ෂ ජනරාල් (ඉංජිනේරු) විසින් ඉදිරිපත් කර තිබුණි. කෙසේ වෙතත්, ණය ප්‍රදාන ආයතනයේ එකඟතාවය ලබා ගැනීමට සහ අදාළ කොන්ත්‍රාත්කරුවන්ට දැනටමත් කර ඇති ගෙවීම් විධිමත් කිරීමට ගෙන ඇති ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳ සාක්ෂි අනාවරණය නොවුණි.	කෙසේ වෙතත්, අනාගත කොන්ත්‍රාත්/ප්‍රසම්පාදන කටයුතු වලදී ක්‍රියා පටිපාටිවලට අනුකූලව කටයුතු කරන ලෙස සියලුම ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන්ට දැඩි ලෙස උපදෙස් ලබාදෙන ලදී.	වගකිව යුතු පාර්ශ්වයන් හඳුනා ගැනීම සඳහා විධිමත් පරීක්ෂණයක් පැවැත්විය යුතුය.
(ඇ)	රට තුළ පැවති ආර්ථික අර්බුදය නිසා ණය මුදල් සීමා කිරීම හේතුවෙන් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීම් අත්හිටුවීමට සිදු වූ අතර, එම කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු හිඟ මුදල් සඳහා පොලී වගකීමක් ඇති විය. එබැවින්, 2024 ජුනි 24 දින අමාත්‍ය මණ්ඩලයට සංදේශයක් ඉදිරිපත් කරන ලද අතර, ඒ වන විටත් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වෙත ලැබී තිබූ සහතික කළ හිඟ කොන්ත්‍රාත් ගෙවීම් පියවීම සඳහා දේශීය අරමුදල්වලින් රු. මිලියන 4,100 ක මුදලක් භාවිතා කිරීම සඳහා 2024 ජූලි 15 දින අනුමැතිය ලබා ගෙන තිබුණි. අමාත්‍ය මණ්ඩල සංදේශයට අමුණා තිබුණු හිඟ අතුරු ගෙවීම් සහතිකවල විස්තර ඇතුලත් උපලේඛන විමර්ශනය කිරීමේදී පහත සඳහන් නිරීක්ෂණයන් විය .		
(i)	දේශීය අරමුදල් භාවිතයෙන් ගෙවීමට අමාත්‍ය මණ්ඩලය විසින් රු. මිලියන 166.20 ක අතුරුගෙවීම් සහතික පහක් අනුමත කරන ලද නමුත්, ඉහත තීරණයට පටහැනිව, සමාලෝචිත වර්ෂය තුළ ණය මුදලින් (ණය අංක 3610) කොන්ත්‍රාත්කරුවන්ට එම ගෙවීම් කර තිබුණි.	මෙම අතුරුගෙවීම් සහතික මූල්‍ය පියවීම් (gap finance) යටතේ වූ නොගෙවූ අතුරුගෙවීම් සහතික උපලේඛණයට ඇතුළත් කර තිබුණද, ණය අංක 3610 සඳහා වෙන් කරන ලද රු. මිලියන 449 ක අතිරේක ණය අරමුදල උපයෝගී කරගනිමින් අදාල මුදල ගෙවන ලදී.	ව්‍යාපෘතිය නිසි ක්‍රියාකාරී සැලැස්මක් සහ අයවැය සකස් කළ යුතු අතර ඒ අනුව වගකීම් නියම කළ යුතුය. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1)(ඇ) වගන්තියේ විධිවිධානවලට අනුකූලව සිදු කරනු ලබන සමාලෝචනයේදී උපදෙස් නිකුත් කළ යුතුය.
(ii)	කොන්ත්‍රාත් පැකේජ අංක කේඑල් 3-ආර් 2 හි අතුරුගෙවීම් සහතික අංක 21	කේඑල් 3 ආර් 2 කොන්ත්‍රාත් පැකේජයේ	-එම-

	හි ගෙවීම 2023 දෙසැම්බර් 01 දින සිදු කර තිබුණද, දේශීය අරමුදල් ලබා ගැනීම සඳහා එය අමාත්‍ය මණ්ඩල සංදේශයේ උපලේඛනයට ඇතුළත් කර තිබුණි.	අතුරුගෙවීම් සහතික අංක 21 සඳහා ගෙවීමක් සිදුකර නොතිබුණි. හිඟ වැඩ ආරම්භකිරීමේ අත්තිකාරම් අයකර ගැනීමට එරෙහිව නියමිත මුදල කපා හැර තිබුණි.	
(iii)	අමාත්‍ය මණ්ඩල සංදේශයේ උපලේඛනවල සහ මූල්‍ය ප්‍රකාශනවල අංක 10.3 උපලේඛනයේ සඳහන් හිඟ ප්‍රමාද පොලී වටිනාකමෙහි රු. මිලියන 49.58 ක වෙනස්කම් නිරීක්ෂණය විය.	ගෙවන ලද අතුරුගෙවීම් සහතික, හිඟ අතුරුගෙවීම් සහතික සහ සිදු කිරීමට අපේක්ෂිත කාර්යය මත වූ අතුරුගෙවීම් සහතික ප්‍රමාණය මත පදනම්ව අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා පොලී මුදල් ගණනය කරන ලද අතර මූල්‍ය ප්‍රකාශන උපලේඛනයේ දක්වා ඇති ප්‍රමාද පොලී වටිනාකම් වලට 2024.12.31 දිනට ගෙවන ලද අතුරුගෙවීම් සහතික වටිනාකම් සහ සත්‍ය වශයෙන් හිඟ අතුරුගෙවීම් සහතික වටිනාකම් ඇතුළත් වේ.	-එම-
(ඇ)	කොන්ත්‍රාත්කරුගේ අඩු ප්‍රගතිය හේතුවෙන් වැඩසටහන යටතේ පුනරුත්ථාපනය කිරීමට සැලසුම් කර තිබූ කොන්ත්‍රාත් පැකේජ හතරක් අවසන් කරන ලද අතර, එම පැකේජ දේශීය බැංකු අරමුදල් ව්‍යාපෘතිය යටතේ එම කොන්ත්‍රාත්කරුටම ලබා දී තිබුණි. දේශීය බැංකු අරමුදල් ව්‍යාපෘතිය හරහා එම කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගත යුතු හිඟ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදල රු. මිලියන 515.59 ක් වුවද, 2024 දෙසැම්බර් 31 දින දක්වා වැඩසටහනට එම හිඟ අත්තිකාරම් අයකර ගැනීමට නොහැකිවී තිබුණු බව නිරීක්ෂණය විය.	දේශීය බැංකු අරමුදල් සහිත ව්‍යාපෘතියට භාර දුන් කොන්ත්‍රාත් පැකේජවලට අදාළව අයවියයුතු රු. 515.59 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදල, වලංගු තත්ත්වයේ ඇති අත්තිකාරම් බැඳුම්කර මුදල් කිරීමෙන් අයකර ගැනීමට නියමිතය.	බැඳුම්කර මුදල් කරගැනීම සම්බන්ධයෙන් ගතහැකි ක්‍රියාමාර්ග තීරණය කිරීම සඳහා අදාළ බලධාරීන් සමඟ සාකච්ඡා කිරීමට පියවර ගත යුතුය. තවද, කොන්ත්‍රාත්කරුට එරෙහිව කොන්ත්‍රාත් කොන්දේසි ප්‍රකාරව කටයුතු කිරීමෙන් තොරව දේශීය බැංකු අරමුදල් ව්‍යාපෘතියට කොන්ත්‍රාත් පැවරීම සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ගයේ අනුකූලතාවය හඳුනා ගැනීම සඳහා පරීක්ෂණයක් පැවැත්විය යුතුය.